# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
# කෘෂි විද්‍යාව
# 13 වසර රචනා

01 (i) රැක්කවීම සඳහා තෝරාගන්නා කිකිළි බිත්තරවල තිබිය යුතු ලක්ෂණ විස්තර කරන්න.

(ii) පලිබෝධ වසංගත තත්ත්වය පලිබෝධ ගහන මට්ටම් අනුව පැහැදිලි කර එවැනි වසංගත තත්ත්ව ඇතිවීමට බලපාන හේතු විස්තර කරන්න.

(iii) බීජ ජීව්‍යතාවයට බලපාන අභ්‍යන්තර හා බාහිර සාධක විස්තර කරන්න.

02 (i) ගොවිපල නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගොවිපල සත්ව අභිජනනය සිදුකළ හැකි ක්‍රම විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ කෘෂි අංශයේ ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා කෘෂි පාරිසරික කලාප හඳුනාගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(iii) සමෝධානිත පලිබෝධ කළමණාකරණය හා එහි ඇති වාසි විස්තර කරන්න.

03 (i) පහත සඳහන් ආහාර පරිරක්ෂණ ක්‍රම පිළිබඳ කෙටි සටහන් ලියාදක්වන්න.

a) පැස්ටරීකරණය
b) ජීවානුහරණය
c) බිලාන්චිකරණය
d) ආශ්‍රැති විජලනය

(ii) ශාක රෝගයක් හට ගැනීමට බලපාන සාධක මඟින් රෝග හටගන්නා ආකාරය හා ව්‍යාප්ත වන ආකාරය පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරුවල පසු අස්වැන්න හානිය නිසා ඇතිවිය හැකි ගැටළු විස්තර කරන්න.

04 (i) ඒකාධිකාරී වෙළඳපොලක් හඳුන්වා එහි පවතින ලක්ෂණ විස්තර කරන්න.

(ii) ජාන සම්පත් හඳුන්වා එහි සංරක්ෂණයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(iii) තවාන් ජීවානුහරණය කළ හැකි විවිධ ක්‍රම පිළිබඳව සාකච්ඡා කරන්න.

05 (i) පාංශු ඛාදනයේ අහිතකර බලපෑම් විස්තර කරන්න.

(ii) ගිබරලින් වල කාර්යභාරය කුමක්ද?

(iii) පසෙහි ජල වහනය දුර්වල වීමෙන් ඇතිවන අහිතකර බලපෑම් මොනවාද?

06 (i) ජෛව පොහොරවල වැදගත්කම විස්තර කරන්න.

(ii) ජල සම්පාදනයේ අරමුණු විස්තර කරන්න.

(iii) බිම් සැකසීමේ පියවර පැහැදිලි කරන්න.